**විල්ගමුව ප්‍රාදේශීය සභාව.**

**---------------------------**

**මාතලේ දිස්ත්‍රික්කය.**

**-----------------------**

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 25 දිනද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 06 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 මතය

**--------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට විල්ගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ වරෙන්තු ගාස්තු බිල්කිරීම් රු.3,932,203 ක් වුවද, ආදායම් වියදම් ගිණුමට රු.8,463,567 ක් ලෙස සටහන් කිරීම හේතුවෙන් ආදායම රු.4,531,362 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ඉඩම් හා ගොඩනැගිලි රු.1,966,573 ක් වැඩියෙන් ප්‍රාග්ධනිත කර තිබුණි.

(ඇ) ස්ථාවර තැන්පතු පොලිය රු.67,681 ක් වුවද රු.108,921 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ස්ථාවර තැන්පත් ශේෂය සහ පොලී ආදායම රු.41,240 ක් වැඩියෙන් දැක්වේ.

(ඈ) ඉකුත් වර්ෂයේ අයකර තිබූ රු.21,500 ක විනෝද බදු ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ඇතුළත් කර තිබුණි.

(ඉ) ඉකුත් වර්ෂයේ දී කර්මාන්ත ණයගැති හා ණයහිමි ලෙස බිල්කරන ලද රු.1,283,466 ක් නැවත සමාලෝචිත වර්ෂයේදීද ණයගැති හා ණයහිමි ලෙස බිල්කිරීම හේතුවෙන් ප්‍රාග්ධන ආදායම් හා වියදම් මෙන්ම ණයගැති හා ණයහිමි ශේෂ එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වේ.

(ඊ) සමාලෝචිත වර්ෂයේ සංවර්ධනය කර තිබූ පේරකනත්ත ගමමැද මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ රු.249,709 ක ගෙවීම ණයහිමියෝ ලෙස සලකා ගෙවීම හේතුවෙන් ණයහිමි ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වේ.

(උ) හිඟහිටි සතිපොළ ගාස්තු රු.232,488 ක් හා ලැබිය යුතු මුද්දර ගාස්තු රු.46,800ක් ලැබිය යුතු දැ යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් වාර්තාව අනුව බැංකු ගිණුම් ශේෂය රු.100,000 ක් අඩුවෙන් දැක්වේ.

(එ) කර්මාන්ත ණයහිමි ගිණුමේ ශේෂය රු.3,829,878 ක් වුවද , ශේෂ පත්‍රයේ ජංගම වගකීම් වල රු.6,311,917 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා එම ගිණුමේ ශේෂය රු.2,482,039 ක් වැඩියෙන් දැක්වේ.

(ඒ) පරිත්‍යාග ලෙස ලැබී තිබූ පුස්තකාල පොත් 119 ක වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඔ) 2014 වර්ෂයේ ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කිරීම සඳහා යොදන ලද ජර්නල් සටහන් නිවැරදි නොවීම හේතුවෙන් ප්‍රාග්ධන වියදම් රු.72,544 ක් හා සමුච්චිත අරමුදල රු.66,066 ක් වැඩියෙන් දැක්වේ.

(ඕ) ඉකුත් වර්ෂයේ විගණකාධිපති වාර්තාවෙන් පෙන්වා දී තිබූ ඇතැම් ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු යොදා නොතිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

-------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු. 35,827,280ක් වූ ගිණුම් විෂයයන් 06කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර වෙනස්කම් පැවති අතර, නිරීක්ෂණය වූ අසමානතාවල එකතුව රු.3,029,124 ක් විය.

1.3.3 අවිනිශ්චිත ගිණුම

--------------------

ඉකුත් වර්ෂයේ අවසානයට මූල්‍ය ප්‍රකාශන වල දැක්වුණු අවිනිශ්චිත ගිණුමේ වූ රු.657,609 ක බැර ශේෂයට සමාලෝචිත වර්ෂයේ දී රු.6,763,947ක් හර කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.6,106,338 ක හර ශේෂයක් විය.

1.3.4 ලැබිය යුතු ගිණුම්

--------------------

දීර්ඝ කාලයක් තිස්සේ මූල්‍ය ප්‍රකාශනවල නොවෙනස්ව ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු.4,365,811 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 05 ක වටිනාකම නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදී පියවර ගෙන නොතිබුණි.

1.3.5 ගෙවිය යුතු ගිණුම්

---------------------

දීර්ඝ කාලයක් තිස්සේ නිරවුල් කිරීමට පියවර නොගෙන ගිණුම්වල ඉදිරියට ගෙනෙමින් පවතින රු.3,612 ක් වූ ගිණුම් ශේෂයක් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් පියවර ගෙන නොතිබුණි.

1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා ගිණුම් විෂයන් 05 කට අදාළ එකතුව රු.9,329,687ක් වූ ගිණුම් ශේෂ විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.7 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

-------------------------------------------------------

පහත විස්තර දැක්වෙන නීති, රීති හා රෙගුලාසි විධිවිධාන වලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය.

| නීති,රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ජනරජයේ | |
| මුදල් රෙගුලාසි 371 | වසර 07 ක් ඉක්ම වූ එකතු වටිනාකම රු.3,452,089 ක් වූ අත්තිකාරම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2015 ජූලි 14 දිනැති අංක 04/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | මිල ගණන් කැඳවීම තුළින් තරඟකාරී ලෙස රක්ෂණ පහසුකම් ලබා නොගෙන රක්ෂණ නියෝජිතයෙකු මඟින් සභාව සතු වාහන 11 ක් රක්ෂනය කිරීම නිසා සභා අරමුදලට රු.26,037 ක පාඩුවක් සිදු වී තිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,576,228 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.455,125 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.10,121,103 ක වර්ධනයක් නිරීක්ෂණය විය.

2.2 විශ්ලේෂණාත්මක මූල්‍ය සමාලෝචනය

-------------------------------------

(අ) මූල්‍ය ප්‍රතිඵලයේ රු.10,121,103 ක වර්ධනයට ආදායම් විෂයයන් 04 ක වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණද, සමාලෝචිත වර්ෂයේ වරෙන්තු ගාස්තු ආදායම රු.4,531,362කින් අධිගණනය වී ඇති බැවින් සත්‍ය වශයෙන්ම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය වෙනස් වේ.

(ආ) වැඩසටහන් අනුව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන ආදායම් හා වියදම් සසඳා බැලීමේදී වැඩසටහන් 06 න් වැඩසටහන් 02 ක ආදායම ඉක්ම වූ වියදමක් දක්නට ලැබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ වැඩ සටහන් 02 ක ප්‍රාග්ධන ලැබීම් ඉක්ම වූ ප්‍රාග්ධන වියදම් දක්නට ලැබුණි.

2.3 ආදායම් පරිපාලනය
-----------------------

2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්යය සාධනය
-------------------------------------------

සභාව සතු ජල ව්‍යාපෘතින්වල ජල පාරිභෝගිකයන් 121 දෙනෙකු සඳහා ජල මනු සවි කිරීමකින් තොරව ස්ථාවර ගාස්තු අයකර තිබුණු බැවින් සභාවට ලැබිය යුතු විශාල ආදායමක් අහිමි වී තිබුණි.

2.3.2 වරිපනම් බදු
------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි වරිපනම් බදු ශේෂය වූ රු.291,096 ක් වූ අතර, එම ශේෂය තුළ වසරකට වඩා වැඩි කාලයක් ඉකුත් වූ රු.60,509 ක් හා වසර 05 කට වඩා වැඩි කාලයක් ඉක්ම වූ රු.186,638 ක ශේෂයක්ද ඇතුළත් වී තිබුණි.

2.3.3 ජල ගාස්තු
------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි ජල ගාස්තු ශේෂය රු.747,011 ක් වූ අතර, එම ශේෂයට වසර 05කට වඩා වැඩි කාලයක් ඉක්ම වූ රු.161,823 ක ශේෂ ඇතුළත් වී තිබුණි.

2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු
------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.1,335,095 ක මුදලක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු.46,800 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා
-------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාවේ තනතුරු 06 කට අදාළ පුරප්පාඩු 14 ක් සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) රජයේ නිලධාරීන් සඳහා යතුරුපැදි ලබාදීමේ වැඩසටහන යටතේ රජයේ සේවකයන් ලෙස යතුරු පැදි ලබාගත් නිලධාරීන් තිදෙනෙකු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් ලෙසද යතුරුපැදි ලබාගෙන තිබුණි. එක් යතුරුපැදියක මුදල අදාළ මන්ත්‍රීවරුන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතු වුවත් එසේ කර නොතිබුණි.

3.2 කොන්ත්‍රාත් පරිපාලනය
---------------------------

(අ) ලේඩියංගල මහජන පුස්තකාලය සංවර්ධනය
-------------------------------------------------

යථෝක්ත ව්‍යාපෘතියට රු.1,000,000 ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර මීගහඅමුණ ගොවි සංවිධානය සමඟ 2015 පෙබරවාරි 26 දින ගිවිසුම්ගතව කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණි. සමිතියේ මූල්‍යමය හැකියාව හා පෙර ඉටුකරන ලද කර්මාන්ත පිළිබඳ ඇගයීමක් සිදුනොකිරීම නිසා 2015 ජූලි 26 දින වන විට නිම කළයුතු මෙම කර්මාන්තය 2016 මැයි 05 වන විටත් නිම කර නොතිබුණි.

3.3 ව්‍යාපෘති ප්‍රමාද කිරීම

-----------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂනය කරනු ලැබේ.

(අ) පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ඝණ අපද්‍රව්‍ය වැඩසටහනේ කොම්පෝස්ට් අංගනය ඉදිකිරීම සඳහා ලැබී තිබුණු රු.500,000 ක ප්‍රතිපාදනය අදාළ කාල සීමාව තුළ ව්‍යාපෘතිය ඉටු නොකිරීම හේතුවෙන් අවලංගු වී තිබුණි.

(ආ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ යෝජිත ව්‍යාපෘති 05 න් ව්‍යාපෘති 04 ක් නිම කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ දී තාක්ෂණික සේවා ආයතනය මඟින් ඉටුකළ යුතු වටිනාකම රු.685,000 ක් වූ ව්‍යාපෘති 09 ක් ඉටු කිරීමට කටයුතු කර නොතිබුණි.

3.4 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------

සභා බල ප්‍රදේශයේ දෛනිකව එකතු වන මෙට්‍රික් ටොන් 2 ක් පමණ වන කසළ ප්‍රතිචක්‍රීකරණ වැඩපිළිවෙලකට යොදවා නොගෙන ට්‍රැක්ටර් මඟින් දිනපතා නාමින ඔය වැවට ඉහළින් ඇති තිඹිරුත්තාව රජයේ ඉඩමට බැහැර කර තිබුණි. මෙම කසළ වර්ග වෙන් කිරීමක් සිදු නොකර පරිසරයට හානිවන ලෙස බැහැර කර තිබුණි.

4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

-----------------------------------------

4.1 අයවැය පාලනය

------------------

(අ) වැය විෂයයන් 93 ක් සඳහා ඇති කළ රු.රු.2,428,000 ක ප්‍රතිපාදනවලින් කිසිදු වියදමක් දරා නොතිබුණි.

(ආ) වැය විෂයයන් 20 කට අදාලව ශුද්ධ ප්‍රතිපාදනය හා සත්‍ය වියදම අතර, සියයට 30 සිට සියයට 95 දක්වා වූ පරාසයක විචලනයක් පැවතුණි.

(ඇ) ආදායම් විෂයයන් 10ක් සඳහා ඇස්තමේන්තු ගත රු.2,720,000ක ආදායමෙන් කිසිදු ආදායමක් උපයා නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළදී ආදායම් හා වියදම් විෂයයන් අතර ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුවද අයවැයගත හා තථ්‍ය ආදායම් වියදම් අතර සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

---------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාව විසින් ප්‍රසම්පදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

4.3 අභ්‍යන්තර විගණනය

-----------------------

1988 (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 5(7) රීතිය ප්‍රකාරව අභ්‍යන්තර විගණන ක්‍රමයක් පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි.

4.4 විගණන හා කළමනාකරණ කමිටු

---------------------------------------

2014 අගෝස්තු 08 දිනැති පළාත් පලාන කොමසාරිස්ගේ අංක CPC/CCG/1/9/1/4 දරන ලිපිය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවිය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම එම කමිටු පිහිටුවීමට පියවර ගෙන නොතිබුණි.

4.5 වත්කම් කළමනාකරණය

------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

------------------------------------------

සභාව සතු අංක 53-4732 දරන රු.750,000 ක් වටිනා කැබ් රථය , අංක 49-8220 දරන රු.840,000 ක් වටිනා ට්‍රැක්ටර්රථය හා අංක 67-0339 දරන රු.90,000 ක් වටිනා ට්‍රැක්ටර් ට්‍රේලරය වසර 2ක පමණ සිට කිසිදු කාර්යයක් සඳහා යෙදවීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි.

(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

------------------------------

සමාලෝචිත වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණය 2016 මැයි 02 වන විටත් පවත්වා නොතිබුණි.

5. පද්ධති හා පාලන

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) අදායම් පාරිපාලනය
(ඈ) මානව සම්පත් කළමණාකරණය
(ඉ) වත්කම් කළමනාකරණය
(ඊ) කොන්ත්‍රාත් පාලනය